දිවි තොර කරගැනීම් පවා වසංගතයක් ලෙසින් පැතිර යා හැකි බව පර්යේෂකයින් විසින් සඳහන් කරනා කරුණකි. ඊට, දිවි තොර කරගැනීම් සම්බන්ධ මාධ්‍ය වාර්තාද හේතු විය හැක. දිවි තොර කරගැනීම් වාර්තා කිරීමේදී මාධ්‍ය හැකිතාක් ප්‍රවේසම් සහගත විය යුත්තේ ඒ හෙයිනි. නමුත්, මාධ්‍ය කෙතරම් දුරට එය ඉටු කරන්නේ ද යන්න පැනයකි.

උදාහරණයක් ලෙසින්, ගලහ ප්‍රදේශයේ සිසුවියක් තම නිවසේදී දිවි තොර කරගත් පුවතක් මාධ්‍ය තුළ ඉදිරිපත් කිරීමේදී සිදුව තිබූ මාධ්‍ය ආචාර ධර්ම උල්ලංඝනයන් නිරීක්ෂණය කළ හැක.

1) දිවි තොර කරගැනීම් සම්බන්ධ සිදුවීම් මුල් පිටුවේම, ප්‍රමුඛතාවයකින් යුතුව පළ කිරීම ඔස්සේ, ඊට වැඩි අවධානයක් යොමු වන අතර, දිවි තොර කරගැනීමේ නැඹුරුවක් ඇති අයෙකු හට අහිතකර බලපෑමක් වීමට හැක.

2) දිවි තොර කරගත් ආකාරය දැක්වීමත්, එය දීර්ඝ ලෙසින් විස්තර කිරීමත් ඔස්සේ, දිවි තොර කරගැනීමේ නැඹුරුතාවක් ඇති අයෙකු අනුකාරක දිවි තොර කරගැනීම් වෙත යොමු විය හැක.

3) දිවි තොර කර ගැනීමට හේතු අති සරල කොට දැක්වීම ඔස්සේ, එවැනි සමාන සිදුවීමකට මුහුණ දෙන අයෙකු හට දිවි තොර කරගැනීමේ පෙළඹවීමක් ඇති විය හැක. දිවි තොර කරගැනීමක් පසුපස සංකීර්ණ හේතු සාධක පවතී.

4) දිවි තොර කරගත් අයගේ නම ඉදිරිපත් වී තිබිණි. ඒ ඔස්සේ අදාළ පුද්ගලයාගේ පවුලේ සාමාජිකයන් තුළ එම සිදුවීම නිසාත්, දිවි තොර කරගැනීම් හා බැඳුනු සමාජ අගතිය නිසාත්, දැනටමත් ඇති වී තිබිය හැකි සිත් වේදනාවන් සහ මනසික පීඩාවන් තවදුරටත් තීව්‍ර විය හැක.

5) අරුණ හැරෙන්නට අනෙක් සෑම පුවත් වාර්තාවකම උපකාරක අංක සඳහන්ව නොතිබුණි. දිවි තොර කරගැනීම් පිළිබඳ වාර්තාවන් සමග උපකාරක අංක දැක්වීම ඔස්සේ, දිවි තොර කරගැනීමේ නැඹුරුතාවයක් ඇති අයෙකු උපදේශන සේවාවන් වෙත යොමු වීමට පෙළඹවීමත්, ඒ ඔස්සේ ජීවිතයක් ගලවා ගැනීමට පිටුවහලක් ලැබීමත් විය හැක. අරුණ පුවත්පත මෙමෙ පුවත සමගින් හදිසි උපකාරක අංක සඳහන් කර තිබීම ප්‍රශංසා කටයුතු වේ.

දිවි තොර කරගැනීම් වාර්තා කිරීමේදී ඉහත කී මාධ්‍ය ආචාර ධර්ම උල්ලංඝනයන් අවම කර ගැනීමත්, හැකිතාක් ප්‍රවේශම් සහගත ප්‍රවේශයකින් එම පුවත් ඉදිරිපත් කිරීමත් ඔස්සේ, දිවි තොර කරගැනීම් වසංගතයක් ලෙසින් පැතිර යෑම අවම කරගත හැකි වනු ඇත.

(මෙහි දැක්වෙන සිංහල භාෂා පුවත්පත් වල සහෝදර ඉංග්‍රීසි පුවත්පත් තුළ, එම දිනයන් තුළදී මෙම සිදුවීම වාර්තා වී නොතිබුණි)

හදිසි උපකාරක අංක:
CCCline - 1333
ශ්‍රී ලංකා සුමිත්‍රයෝ - 0112682535, 0112682570, 0112818860
ජාතික මානසික සෞඛ්‍ය ආයතනය - 1926 (දුරකථන ඇමතුම් හෝ කෙටි පණිවිඩ මාර්ගයෙන් සම්බන්ධ කර ගත හැක)

මූලාශ්‍ර:

https://www.hhs.gov/.../what-does-suicide.../index.html
https://apps.who.int/.../WHO-MSD-MER-17.5-eng.pdf...